## ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

# බුද්ධධර්මය/පාලි/සංස්කෘත ඩිප්ලෝමා/ උසස් ඩිප්ලෝමා - 2020

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය මගින් 2020 වර්ෂයේ දී පැවැත්වීමට නියමිත ඉහත සඳහන් ඩිප්ලෝමා පාඨමාලා සඳහා ලියාපදිංචි වීමට සුදුසුකම් ලත් අපේක්ෂකයන්ගෙන් 2020.01.31 දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ. අපේක්ෂකයකුට එක් වරකට ලියාපදිංචි විය හැක්කේ එක් පාඨමාලාවක් සඳහා පමණි.

## ලියාපදිංචි වීම සඳහා සුදුසුකම් :

### බුද්ධධර්ම/පාලි/සංස්කෘත ඩිප්ලෝමා : (SLQF Level 03-30 Credits)

- අ.පො.ස. (සා. පෙළ) හෝ පිරිවෙන් අවසාන විභාගය අවම වශයෙන් විෂයයන් 06කින් සමත්වීම.

  හෝ

- ධර්මාචාර්ය විභාගය සම්පූර්ණ කර තිබීම.

  හෝ

- ඕනෑම විෂය ධාරාවක් යටතේ අ.පො.ස. (උ. පෙළ) සමත් ව තිබීම.

### බුද්ධධර්ම/පාලි/සංස්කෘත උසස් ඩිප්ලෝමා පාඨමාලාව (SLQF Level 04-30 Credits)

- මෙම විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන බුද්ධධර්ම/පාලි/සංස්කෘත ඩිප්ලෝමා පාඨමාලාව සමත් ව තිබීම

  හෝ

- බුද්ධධර්මය/බෞද්ධ ශිෂ්ටාචාරය/පාලි/සංස්කෘත ඇතුළු ව අ.පො.ස. (උ. පෙළ) විභාගය සමත් ව තිබීම

  හෝ

- බුද්ධධර්ම/පාලි/සංස්කෘත යන විෂයයන් සහිත ව අ.පො.ස. (සා. පෙළ) හෝ පිරිවෙන් අවසාන විභාගය සමත් ව තිබීම හා ඕනෑම විෂය ධාරාවක් යටතේ අ.පො.ස. (උ. පෙළ) සමත් ව තිබීම.

**අධ්‍යයන මාධ්‍යය** : සිංහල/ඉංග්‍රීසි

**පාඨමාලා කාලය** : සෑම පාඨමාලාවක ම කාලය වසර එකකි.

**ගාස්තු :**

| | | |
|---|---|---|
| බුද්ධධර්ම/පාලි/සංස්කෘත ඩිප්ලෝමා | : | රු. 31,500/- |
| බුද්ධධර්ම/පාලි/සංස්කෘත උසස් ඩිප්ලෝමා පාඨමාලාව | : | රු. 36,500/- |

**අයදුම්පත් ලබා ගත හැකි ආකාරය :**

විස්තර හා අයදුම්පත් පැමිණ ලබා ගන්නේ නම්, 2020.01.28 දින දක්වා සතියේ වැඩ කරන දිනවල ප.ව. 3.00ට පෙර **214, බෞද්ධාලෝක මාවත, කොළඹ 07, පරිශ්‍රයේ පිහිටි ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි හා බාහිර විභාග මධ්‍යස්ථානයේ** සරප් වෙත මුදල් ගෙවා හෝ දිවයිනේ ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් හෝමාගම ලංකා බැංකු ශාඛාවේ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ගිණුම් අංක **711202** දරන ගිණුමට බැර වන පරිදි රු. 500/- ක් ගෙවා ලබා ගන්නා ලද ලදුපත ඉදිරිපත් කිරීමෙන් ලබා ගත හැකි ය.

තැපැල් මගින් අයදුම්පත් හා විස්තර ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ නම් දිවයිනේ ඕනෑ ම ලංකා බැංකු ශාඛාවකින් හෝමාගම ලංකා බැංකු ශාඛාවේ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ගිණුම් අංක **711202** දරන ගිණුමට බැර වන පරිදි රු. 500/- ක් ගෙවා ලබා ගන්නා ලද ලදුපත සමග තම නම, ලිපිනය ලියන ලද 9″x 4″ ප්‍රමාණයේ රු. 40/-ක මුද්දර ඇලවූ කවරයක් **පහත සඳහන් ලිපිනයට එවීමෙන්** ලබා ගත හැකි ය. **චෙක්පත් හෝ තැපැල් ඇණවුම් භාර ගනු නො ලැබේ.** අයදුම්පත් ලබා ගැනීම සඳහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **අදාළ පාඨමාලාවේ නම සඳහන් කර - "අයදුම් පත්‍ර ලබා ගැනීම යනුවෙන්"** සඳහන් කළ යුතු ය.

**නියෝජ්‍ය ලේඛකාධිකාරී,**
**ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,**
**පශ්චාද් උපාධි හා බාහිර විභාග මධ්‍යස්ථානය,**
**214, බෞද්ධාලෝක මාවත,**
**කොළඹ 07.**

විශ්වවිද්‍යාලයේ www.bpu.ac.lk යන වෙබ් අඩවිය මගින් ද අයදුම් පත් ලබා ගත හැකිය. වෙබ් අඩවියෙන් ලබා ගන්නා අයදුම් පත්‍ර සඳහා 711202 ලංකා බැංකුවේ විශ්වවිද්‍යාලයේ ගිණුමට බැර කරන ලද රු. 500.00ක් ගෙවූ බැංකු රිසිට් පත සම්පූර්ණ කළ අයදුම් පත්‍ර සමඟ අමුණා එවිය යුතු ය.

**සැ.යු. : බැංකුවට ගාස්තු ගෙවීමේ දී ගෙවීම් වවුචර පතේ තම නම ඉදිරියෙන් "B/Dip" යන සංකේතය සටහන් කළ යුතුය.**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය **2020.01.31** වේ. **නිසියාකාර ව සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉහත ලිපිනයට යොමු කළ යුතු ය.** අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. අයදුම්පත් එවනු ලබන කවරයෙහි වම් පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන පාඨමාලාවේ නම **''බුද්ධධර්ම/පාලි/සංස්කෘත සඳහා අයදුම්පත''** යනුවෙන් සඳහන් කළ යුතු ය. **අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයෙන් පසු ව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

වැඩි විස්තර සඳහා: 011-2580609/011-2502944/011-2593604

**ලේඛකාධිකාරී**
**ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය**
**2019.12.24**